# ALGEBRIC FRACTION

## හරයේ අසමාන විජීය පද සහිත භාග සුළු කිරීම

මෙහි දී භාග දෙකෙහි හරය සමාන වන ලෙස එක් එක් භාගයට තුල්‍ය භාග ලියා සුළු කරනු ලැබේ. (හරයේ කු.පො.ගු. ගැනීමෙන්)

$$\frac{2}{X} + \frac{3}{2X} = \frac{4}{2X} + \frac{3}{2X}$$
$$= \frac{7}{2X}$$

## හරයේ අසමාන ද්විපද ප්‍රකාශන සහිත වීජීය භාග සුළු කිරීම

මෙහි දී ද, ඉහත පරිදි ම, හරයේ වීජීය ප්‍රකාශනවල කු.පො.ගු. සොයා එක් එක් භාගයට තුල්‍ය භාග ලිවීමෙන් පසු සුළු කරනු ලැබේ.

ClassWork.LK

## වීජීය භාග ගුණ කිරීම

භාග සංඛ්‍යාවක් තවත් භාග සංඛ්‍යාවකින් ගුණ කරන ආකාරයට ම වීජීය භාගයක් තවත් වීජීය භාගයකින් ගුණ කිරීම සිදු කළ හැකි ය.

$$\frac{X}{2} \times \frac{X}{3} = \frac{X^2}{6}$$

## වීජීය භාගයක් තවත් වීජීය භාගයකින් බෙදීම

භාගයක් තවත් භාගයකින් බෙදීමේ දී මුල් භාගය දෙවන භාගයේ පරස්පරයෙන් ගුණ කර පිළිතුර ලබාගන්නා ආකාරයට වීජීය භාගයක් තවත් වීජීය භාගයකින් බෙදීමේ දී ද පරස්පරයෙන් ගුණ කිරීම සිදු කළ හැකි ය.

$$\frac{3}{x} \div \frac{4y}{x} = \frac{3}{x} \times \frac{x}{4y}$$

$$= \frac{3}{4y}$$

( $\frac{4y}{x}$ ගෙන් බෙදීම වෙනුවට එහි පරස්පරය වන $\frac{x}{4y}$ ගෙන් ගුණ කිරීම )

ClassWork LK

ClassWork.LK